**ශීර්ෂය 135 - වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය පිළිබඳ විගණකාධිපති වාර්තාව 2016 වර්ෂය**

ශීර්ෂය 135 - වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම, ආදායම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2017 ජූලි 03 දින අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

විසර්ජන ගිණුම, ආදායම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

**2.1 විසර්ජන ගිණුම**

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

අමාත්‍යාංශය සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 9,556.69 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 7465.67 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව අමාත්‍යාංශය වෙත සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 2091.03 ක් හෙවත් සියයට 21.88 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2016 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| පුනරාවර්තන | 2949.85 | 2704.62 | 245.23 | 8.31 |
| මූලධන | 6606.85 | 4761.05 | 1845.80 | 27.94 |
| **එකතුව** | **9556.70** | **7465.67** | **2091.03** | **21.88** |

## 2.2 ආදායම් ගිණුම

### ඇස්තමේන්තුගත හා තථ්‍ය ආදායම

අමාත්‍යාංශය විසින් 2016 වර්ෂය සඳහා අංක 20.02.01.04 දරන ආදායම් සංකේතය සඳහා එකතුව රු.මිලියන 900 ක ආදායම් ඇස්තමේන්තු කර තිබුණු අතර සමාලෝචිත වර්ෂයේදී එකතුව රු.මිලියන 767.33 ක ආදායමක් රැස්කර තිබුණි. එය ඇස්තමේන්තුගත ආදායමෙන් සියයට 85 ක් වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| ආදායම් සංකේතය | 2016 දෙසැම්බර් 31 දිනට | | | ඌනතාවය ඇස්තමේන්තුගත ආදායමේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | සංශෝධිත ඇස්තමේන්තුගත ආදායම | තථ්‍ය ආදායම | ඌනතාවය | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| 20.02.01.04 | 900.00 | 767.33 | 132.67 | 14.74 |

## 2.3 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

### පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්

අමාත්‍යාංශයට අදාළ විෂය අංක 13501 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ .

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 20.00 | 12.47 | 6.50 | 9.29 | 55.10 | 26.18 |

## 2.4 පොදු තැන්පත් ගිණුම්

අමාත්‍යාංශය යටතේ වන පොදු තැන්පත් ගිණුම් 4 ක 2016 දෙසැම්බර් 31 දිනට ශේෂ එකතුව රු.මිලියන 1.23 ක් විය. විස්තර පහත දැක්වේ.

| පොදු තැන්පත් ගිණුම් අංකය | 2016 දෙසැම්බර් 31 දිනට ශේෂය |
| --- | --- |
| | රු. මිලියන |
| 6000/0000/00/0019/0016/000 | 0.90 |
| 6000/0000/00/0020/0008/000 | 0.17 |
| 6000/000/00/0018/0067/000 | 0.15 |
| 6000/000/00/0002/0108/000 | 0.01 |
| **එකතුව** | **1.23** |

## 2.5 විගණන නිරීක්ෂණය

වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම, ආදායම් ගිණුම, හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති පරිදි කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

## 3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

### 3.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

අමාත්‍යාංශය විසින් පහත දැක්වෙන ඇතැම් ලේඛන පවත්වා නොතිබුණු අතර ,ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | ලේඛන වර්ගය | අදාල රෙගුලාසිය | නිරීක්ෂණ |
| --- | --- | --- | --- |
| (අ) | ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | යාවත්කාලීන කර නොතිබුණි. |
| (ආ) | බැරකම් පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 214 | පවත්වා නොතිබුණි. |
| (ඇ) | ප්‍රසම්පාදන කමිටුවේ හා තාක්ෂණ ඇගැයීම් කමිටුවල පැමිණීමේ ලේඛනය | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ මාර්ගෝපදේශය 2.11.2 | පවත්වා නොතිබුණි. |

## 3.2 විසර්ජන ගිණුම

### අයවැය විචලනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ප්‍රාග්ධන වැය විෂයන් 3 ක් සඳහා සළසා තිබුණු රු.මිලියන 443.10 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරිවී තිබුණි.

(ආ) වැය විෂයයන් 26 ක් සඳහා අධි ප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු එම වැය විෂයයන් වල ඉතිරිය අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 15 සිට සියයට 97 දක්වා අතර පරාසයක් ගෙන තිබුණි.

(ඇ) පරිපූරක ප්‍රතිපාදන ලෙස වැය විෂයන් 3කට ලබාගෙන තිබූ එකතුව රු. මිලියන 162.2 ක් වූ සම්පූර්ණ ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි.

## 3.3 ආදායම් ගිණුම්

අමාත්‍යාංශ ලේකම්වරයා ආදායම් ගණන්දීමේ නිලධාරියා වශයෙන් 20.02.01.04 දරන ආදායම් සංකේතයට අදාල ආදායම් ඇස්තමේන්තු පිළියෙල කිරීම, ආදායම් රැස්කිරීම, ගිණුම්ගත කිරීම හා ගිණුම් ඉදිරිපත් කිරීමේ කාර්යභාරයන් පැවරී තිබුණි. එම ආදායම් සංකේතයට අදාළව සිදු කළ නියැදි විගණනයේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) වැවිලි සමාගම්වලට අයත් වතු 571 ක ඉඩම්වලින් යටිතල පහසුකම් වැනි පොදු කටයුතු සඳහා ඉඩම් ලබා දී තිබුණි. මෙම පවරන ලද ඉඩම්වල නිවැරදි භූමි ප්‍රමාණයන් හඳුනා ගැනීමට, සීමා මායිම් නිර්ණයට අදාල සාක්ෂි අමාත්‍යාංශය සතුව නොවීය.

(ආ) අගරපතන, උඩුපුස්සැල්ලාව, ඇල් කඩුව යන සමාගම් 03 ට අයත් වතු 45 ක් සඳහා 1992 වර්ෂයේ සිට බදු කුලී අයකර ගෙන නොතිබුණි.

(ඇ) ප්‍රාදේශිය වැවිලි සමාගම් සමඟ ඇතිකරගෙන තිබූ බදු ගිවිසුම අනුව වාර්ෂික බදු ආදායම කාර්තු පදනම මත ගිවිසුමේ සඳහන් දිනයන්ට පෙර ගෙවිය යුතු වුවත් හපුගස්තැන්න,ඇල්පිටිය, හලාවත, කුරුණෑගල වැවිලි සමාගම් වල 2017/2016, 2016/2015 වර්ෂවල බදු කුලී ගෙවීමේදී නියමිත දිනය ඉක්මවා මාස 01 සිට මාස 07 දක්වා කාලසීමාවක් ප්‍රමාද කිරීමෙන් පසුව රු.145,532,511 ක බදු කුලී ගෙවා තිබුණි.

## 3.4 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

විගණනයට ඉදිරිපත් කළ විෂය අංක 13501 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු. 1,175,543 ක් වූ අතර, එම හිඟහිටි ශේෂ වර්ෂ 1 ක සිට වර්ෂ 32 ක් දක්වා කාල පරාසයක් ගෙන තිබුණි.

## 3.5 යහ පාලනය හා ගිණුම් කටයුතුභාවය

### 3.5.1 උපචිත පදනම මත මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම

2016 දෙසැම්බර් 19 දිනැති අංක 252/2016 දරන රාජ්‍ය ගිණුම් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ චක්‍රලේඛය 9 වගන්තිය පරිදි අමාත්‍යාංශය විසින් විසර්ජන ගිණුමට අමතරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර නොතිබුණි.

### 3.5.2 වත්කම් කළමනාකරණය

අමාත්‍යාංශයේ වත්කම් සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරික්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරික්ෂණය විය.

#### (අ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම

2016 දෙසැම්බර් 31 දිනට වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්තා අනුව සමහර වත්කම් ඉන්වෙන්ට්‍රි ලේඛනවලට ගෙන නොතිබූ බව වාර්තා කර තිබුණි.

#### (ආ) බාහිර පාර්ශවයන් වෙත දී ඇති වත්කම්

අමාත්‍යාංශය විසින් රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව හා තුරුසවිය අරමුදල වෙත මෝටර් වාහන 04 ක් මුදාහැර තිබුණි.

**3.6 අනුකූල නොවීම්**

**-----------------**

**නීති, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම**

**-------------------------------------------------------**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | **නීති, රීති හා රෙගුලාසිවලට යොමුව**<br>**-----------------------------** | **අනුකූල නොවීම**<br>**--------------------** |
|---|---|---|
| (අ) | **ව්‍යවස්ථාපිත විධිවිධාන**<br>**---------------------------** | |
| | 2009 නොවැම්බර් 11 දිනැති කැබිනට් මණ්ඩල තීරණය | උපබද්දු දීමට පෙර ස්වර්ණමය කොටස් හිමිකරුගේ අනුමැතිය ලබාගත යුතු වුවත් 2014 සහ 2015 වර්ෂවලදී ප්‍රාදේශීය වතු සමාගම් 08 කට අයත් ඉඩම් කොටස් 18 ක් සමාගම් 14 කට උපබද්දු දී දීමේදී කොටස් හිමිකරු ලෙස භාණ්ඩාගාර ලේකම්ගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. |
| (ආ) | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය**<br>**-----------------------------** | |
| | මුදල් රෙගුලාසි 175 (2) | සමාලෝචිත වර්ෂයට අදාල රු.310,241,909 ක කල්බද්දු කුලී ආදායම් අයකර ගත නොහැකිව තිබුණි. එසේම අගලවත්ත, කොටගල සහ කහවත්ත යන සමාගම් සඳහා ඇස්තමේන්තු කර තිබූ රු.144,356,993 ක ආදායමෙන් එක් වාරිකයක් හෝ අයකර ගෙන නොතිබුණි. |
| (ඇ) | 2015 ජූලි 10 දිනැති අංක 02/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | ලියාපදිංචි කර වසර 10කට වැඩි අපහරණය සඳහා හඳුනාගත් වාහන 3ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබිණි. |

## 3.7 විදේශාධාර ව්‍යාපෘති

විදේශ ණය ආධාර ව්‍යාපෘති 02 ක් සඳහා 2016 වර්ෂයට ඇස්තමේන්තු කර තිබුණු රු.මිලියන 885.9 ක ප්‍රතිපාදන වලින් එක් ව්‍යාපෘතියක් සඳහා පමණක් රු.මිලියන 306.5 ක ණය ආධාර ලැබී තිබුණි. අනෙක් ව්‍යාපෘතියේ ගිවිසුම 2016 අප්‍රේල් 26 දින අත්සන් කර තිබුණ ද සමාලෝචිත වර්ෂයට සලසා තිබූ විදේශ ණය ආධාර රු.මිලියන 441.4 උපයෝජනය කර නොතිබුණි.

## 3.8 කාර්යසාධනය

2016 වාර්ෂික අයවැය ඇස්තමේන්තුව හා ක්‍රියාකාරී සැලැස්ම අනුව අමාත්‍යාංශයේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

(අ) තේ, රබර්, පොල් වතු (කැබලි කිරීම පාලන) මණ්ඩලයේ අරමුණ තේ, රබර්, පොල් වතු කැබලි කිරීම, පාලනය සිදු කිරීම වුවද, කැබලි කිරීම සඳහා ලැබෙන අයදුම් පත් ප්‍රමාණය සහ ඒ සඳහා අනුමැතිය ලබා දීම් ඉහළ යමින් පැවතුනි.

(ආ) තේ, රබර්, පොල් වතු (කැබලි කිරීම පාලන) මණ්ඩලය මගින් කොන්දේසි සහිතව ඉඩම් පැවරීම සඳහා අනුමැතිය ලබා දුන් පසුව අදාල කොන්දේසි අනුව කටයුතු කරන්නේද යන්න පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය මගින් පසු විපරම් කිරීමක් සිදුකර නොතිබුණි.

(ඇ) අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක 10/2588/437/010 මගින් තේ, රබර්, පොල් වතු (කැබලි කිරීම පාලන) පනතෙහි පොල් ඉඩම් සඳහා පනවා තිබූ අක්කර 10 යේ සීමාව අක්කර 5 දක්වා අඩුකොට සංශෝධනය කිරීම සඳහා 2010 නොවැම්බර් 10 දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී තිබුණි. එසේ නමුත් 2017 පෙබරවාරි 15 විගණිත දිනය දක්වා අදාල සංශෝධන කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඈ) පලාත් පාලන ආයතනවල ඉඩම් කැබලි කිරීම සඳහා අවසරය ලබාදීමේදී මණ්ඩලයේ අනුමැතිය ලබාගෙන තිබේද යන්න පරීක්ෂා කර නොතිබුණි.

(ඉ) ඉඩම් කැබලි කිරීම පාලන පනතේ 12 (8) හා 24 වගන්තිය ප්‍රකාරව තේ, රබර්, පොල් වතු (කැබලි කිරීම පාලන) මණ්ඩලය අදාල කාර්යයන් ඉටු කිරීමේ රෙගුලාසි පිළිබඳව ගැසට් පත්‍රයේ පළකර පාර්ලිමේන්තු අනුමැතිය ලබාගෙන නොතිබුණි.

(ඊ) පොල් වතු කැබිලි කිරීම සීඝ්‍රයෙන් ඉහළ යෑමක් සිදුවන බැවින් ඒ පිළිබඳ විශේෂ අවධානයක් යොමු කරමින් පනත තුළ පවතින දුර්වලතා අවම කර ගැනීමට සංශෝධන ඇතුළත් වන පරිදි පනත සංශෝධනය කර වගාවන් ආරක්ෂා කර ගැනීම සඳහා ක්‍රියාමාර්ග ගැනීමේ කාලීන අවශ්‍යතාවයක් ඉටු කර නොතිබුණි.

(උ) 2016 අප්‍රේල් 06 දින තේ, රබර්, පොල් වතු (කැබලි කිරීම පාලන) මණ්ඩලයේ 128 වන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී කැබලිකරණය සඳහා ඉල්ලුම්කර ඇති ඉඩම් සම්බන්ධයෙන් ක්‍රියා මාර්ග ගැනීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ කමිටුවක් පත් කිරීමට සහ ක්ෂේත්‍ර පරීක්ෂණය සඳහා අධ්‍යක්ෂ මණ්ඩල

සාමාජිකයන් තිදෙනකුගේ හෝ ඊට වැඩි පිරිසකගේ ක්ෂේත්‍ර පරීක්ෂණයක් පවත්වා තීරණ ගැනීම සුදුසු බව තීරණය කර තිබුණද එම යෝජනාව ක්‍රියාත්මක කර නොතිබුණි.

(ඍ) වැලිගම පොල්කොළ මැලවීමේ හා කුණු වීමේ රෝග මර්ධන වැඩ සටහන සඳහා වර්ෂ 2008 සිට වර්ෂ 2016 දක්වා ගාල්ල, මාතර හා හම්බන්තොට යන දිස්ත්‍රික්ක වල රෝගය වැලඳීම නිසා ඉවත් කළ ගස් ගණන 288,683 ක් විය. ඒ සඳහා ගෙවා තිබුණු වන්දි මුදල රු. 305,414,680 ක් ද අනෙකුත් වියදම් එකතුව රු.75,363,281 ක් වුවද මෙම රෝගයට මුහුණදිය හැකි සාර්ථක පොල් ප්‍රභේදයක් හඳුන්වා දීමට හෝ සම්පූර්ණයෙන්ම රෝග මර්ධනය කිරීමට ආයතනයට නොහැකි වී තිබුණි.

(එ) පරිපාලන දිස්ත්‍රික්ක 15 ක් පුරා පවතින ඉඩම් හෙක්ටයාර 260,000 කින් ඉඩම් හෙක්ටයාර 182,284.54 ක ප්‍රමාණයක් මැනීම සඳහා ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුවට 2012 වර්ෂයේ සිට ලබා දී තිබුණි. 2016 දෙසැම්බර් 31 දිනට දිස්ත්‍රික්ක 7 ක ඉඩම් හෙක්ටයාර 31,435.12 ක් (සියයට 16.6) මැන තිබුණි. ඒ සඳහා එකතුව රු. මිලියන 9.09 ක් වියදම් කර තිබූ අතර ප්‍රතිපාදන උපයෝජනය සියයට 22.7 ක් තරම් පහළ මට්ටමක තිබුණි.

(ඒ) තවද ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුවට මැනීම සඳහා ඉදිරිපත් කර ඇති දිස්ත්‍රික්ක 12 ක ඉඩම් හෙක්ටයාර 45,726.65 ක මැනුම් කටයුතු ආරම්භ කර නොතිබූ අතර මැනුම් කටයුතු ආරම්භ කර තිබූ දිස්ත්‍රික්ක වල මිනුම් නොකළ ඉඩම් ප්‍රමාණය සියයට 52.9 සිට සියයට 91 දක්වා පරාසයක විය.

(ඔ) 2008 වර්ෂයේ සිට 2016 දක්වා මැනීමට දුන් හෙක්ටයාර 189,284 ක් වූ ඉඩම් වලින් හෙක්ටයාර 15,382.93 කට අදාළ සිතියම් 90 ක් පමණක් ලබා දී තිබුණි.

(ඕ) 2016 දෙසැම්බර් 31 දිනට ප්‍රාදේශීය වැවිලි සමාගම් හතරකට අයත් වතු දාහතරක (14) මැනීම් කටයුතු අවසන් කර තිබූ අතර එම වතු වල මැනුම් කටයුතු සඳහා මිනින්දෝරු දෙපාර්තමේන්තුවට ලබා දුන් ඉඩම් ප්‍රමාණය සහ මිනුම් කටයුතු සිදුකල පසු පවතින භූමි ප්‍රමාණය අතර ඉඩම් හෙක්ටයාර් 389.49 ක අඩුවීමක් පවතින බව නිරීක්ෂණය විය. මෙම අඩු වූ භූමි ප්‍රමාණය පිළිබඳ ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ක) වර්ෂ 2016-2018 තුළ ක්‍රියාත්මක කිරීමට යෝජිත ජෛව රසායනික ක්‍රමයක් මඟින් තේ කඳ විදින ගුල්ලාගෙන් වන හානිය පාලනය කිරීමට ක්‍රමෝපායන් දියුණු කිරීමේ ව්‍යාපෘතිය යටතේ රසායන ද්‍රව්‍ය මිශ්‍ර කිරීම සඳහා HCCP යන්ත්‍රයක් (chemical mixing machine) රු. මිලියන 16.05 ක් වැයකර ලබාගෙන තිබුණි. ව්‍යාපෘතියෙන් අපේක්ෂිත භෞතික ප්‍රගතිය වාර්තා කර නොතිබූ අතර කඳ විදින ගුල්ලාගෙන් වන හානියට සාර්ථක පිලියමක් සොයාගෙන නොතිබුණි.

**3.9 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

----------------------------------

2009 ජුනි මස 10 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව තේ, රබර්, පොල් වතු (කැබලි කිරීම පාලනය) මණ්ඩලය වෙනම ආයතනයක් ලෙස ස්ථාපනය කිරීම අවශ්‍ය නොවන බව දක්වා තිබුණ ද මණ්ඩලයට සභාපතිවරයකු පත් කර ඇති අතර ඒ වෙනුවෙන් වැටුප් සහ ඉන්ධන දීමනා සඳහා 2016 වර්ෂය තුලදී එකතුව රු.1,093, 800 ක් දරා තිබුණි.

3.10 **ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ක්‍රියා පටිපාටියෙන් බැහැර වීම.**

අමාත්‍යාංශය එළඹ තිබූ ඇමති කාර්යාලයේ අභ්‍යන්තර වෙන් කිරීම් කොන්ත්‍රාත්තුවට අදාළ රු. 7, 247,100 ක් වූ මුළු පිරිවැය ඇස්තමේන්තුවේ දැවවලින් අභ්‍යන්තර වෙන්කිරීම් වර්ග අඩි 14.50 ක් වුවද වර්ග අඩි 21.75 ක් දක්වා වෙනස් කිරීම නිසා මුළු පිරිවැය ඇස්තමේන්තුව සියයට 49 කින් වැඩි වීමට අනුමැතියක් ලබා ගෙන නොතිබුණි. මෙම කොන්ත්‍රාත්තුවේ රු. 4,354,111 ක පළමු බිල්පත් ගෙවීමට අදාළව ගෙවීම් වවුචර් විගණනය සඳහා ඉදිරිපත් නොවීය.

**3.11 පාඩු හා හානි**

නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ පාඩු හා හානි පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

(අ) වාහන 03 කට අදාලව සිදු වූ අලාභ හානි වලින් ආවරණය කරගත නොහැකි වූ මුදල රු. 4,844,050 ක් විය.

(ආ) 2012 වර්ෂයේ දී රු.232,500 ක ගබඩාවේ භාණ්ඩ නැතිවීම නිසා සිදුවූ අලාභයන් වගකිව යුතු පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**3.12 අනාර්ථික ගනුදෙනු**

නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ අරපිරිමැස්මෙන් තොරව එළඹ තිබුණු ගනුදෙනු පිළිබඳ විස්තර පහත දැක්වේ.

(අ) වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ පවත්වාගෙන ගිය ඇමති කාර්යාලයේ භාවිතා කිරීමට සුදුසු තත්වයේ තිබූ කාර්යාල ඉඩකඩ නවීකරණය කිරීම සඳහා රු. 7,143,752 ක (වැට් රහිත) කොන්ත්‍රාත් ගිවිසුමකට එළඹ තිබුණි.

(ආ) වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය විසින් භාවිතා කරනු ලබන අන්තර්ජාල සම්බන්ධතා පද්ධතිය (ILL) 2014 දෙසැම්බර් වර්ෂයේදී 1Mbps සිට 3 Mbps දක්වා ද 2015, වර්ෂයේදී 3 Mbps සිට 5 Mbps දක්වාද ඉතා කෙටි කාලයක් තුළ වර්ධනය කර තිබුණද ධාරිතාවය වැඩි කිරීමට තරම් ප්‍රමාණවත් හේතුවක් නොවීය. එ නිසා අන්තර්ජාල වියදම 2015 වර්ෂයේදී රු. 1,684,995 ක් වුවද 2016 වර්ෂයේදී රු. 2,530,997 ක් වූයෙන් එය රු. 846,002 කින් එනම් සියයට 50 කින් වැඩිවී තිබූ අතර අනර්තර්ජාලය අවභාවිතය වැලැක්වීමට අභ්‍යන්තර පාලන ක්‍රම හඳුන්වාදී නොතිබුණි.

(ඇ) 2014-2015 වර්ෂවල කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ ප්‍රාදේශීය කලාප 8 ක කුඩා තේ වතු අක්කර ¼ හා අක්කර 1ට අඩු කාණ්ඩයේ සියළුම කුඩා තේ වතු හිමියන්ට පාංශු සංරක්ෂණ සහනාධාරය ලබා දී තිබුණි. මේ මගින් අතිරේක අමු තේ කිලෝ මිලියන 10 කින් වැඩිවීම හා විදේශ විනිමය රු.මිලියන 9010 කින් වැඩි වීම අපේක්ෂා කළ ද එම ඉලක්ක කරා ලගා වී නොතිබුණි.

**3.13 කළමනාකරණ දුර්වලතා**

**-----------------------------**

නියැදි විගණන පරීක්ෂණවලදී පහත සඳහන් දුර්වලතා නිරීක්ෂණය විය.

(අ) කුරුණෑගල වැවිලි සමාගමෙන් 2009 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා හිඟ බදු කුලී ලෙස රු. 124,303,707 ක් අයකර ගත යුතුව තිබුණි. 2016 දෙසැම්බර් 31 දිනට එයින් රු.7,501,974 ක් පමණක් අයකරගෙන තිබූ අතර ඉතිරි රු. 116,801,733 ක් අයකර ගැනීම සඳහා ක්‍රියාමාර්ග ගැනීම දුර්වල තත්ත්වයක පැවතුණි.

(ආ) 2015 දෙසැම්බර් 31 දිනට තලවකැලේ වැවිලි සමාගම් වලින් ලැබිය යුතුව තිබූ හිඟ බදු කුලී ආදායම් රු. 4,800,000 ක් 2016 වර්ෂයේ ද නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) 2016 අගෝස්තු 01 දින කප්රුක අරමුදල් කළමනාකරණ මණ්ඩලයේ ප්‍රථම අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීමේදී ගනු ලැබූ තීරණය අනුව කලාප සමිති වලට ලබා දී ඇති භාවිත නොකරන ලද මුදල් නැවත අයකරගෙන ප්‍රාථමික සමිති වලට ලබා දීමට තීරණය කර තිබුණි. ඒ අනුව 2011 සිට 2013 දෙසැම්බර් 31 දින දක්වා ලබා දී තිබූ රු. 20,895,000 ක මුදලින් 2016 දෙසැම්බර් 31 දින දක්වා රු.2,092,861 ක් පමණක් අයකරගෙන තිබූ අතර රු.18,802,139 ක් අය කරගත යුතුව තිබුණි.

(ඈ) 2005 අංක 31 දරණ කප්රුක අරමුදල පනතේ 21 වගන්තිය ප්‍රකාරව 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශ පිළියෙල කර විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. තවද පනතේ 20 ඡේදය පරිදි කප්රුක සමිතිවලට අයත්ව තිබෙන සියළු නිශ්චල හෝ චංචල දේපළ එම දිනයේ සිට බලපැවැත්වෙන පරිදි අරමුදල සතු බව දක්වා ඇතත් කප්රුක සමිතිවල 2016 දෙසැම්බර් 31 දිනට වූ ශේෂ පිළිබඳ වාර්තා අරමුදල වෙත ගෙන්වා ගෙන නොතිබුණි.

(ඉ) 2016 අගෝස්තු 18 දින වැවිලි කළමනාකරණ අධීක්ෂණ අංශය සඳහා කුලියටගත් ගොඩනැගිල්ල භාවිතා කර නොතිබීම හේතුවෙන් ඒ සඳහා වැය කළ රු. 2,250,000 ක මුදල නිෂ්ඵලව තිබුණි.

(ඊ) කුලියට ගත් ගොඩනැගිල්ලේ හදිසි විදුලි බිඳ වැටීමකදී භාවිතා කරනු ලබන ජෙනරේටරය ක්‍රියාත්මක කිරීම සඳහා මුරකරුවෙකුට මසකට රු. 25,000 බැගින් ගෙවා තිබුණි.

(උ) 2016 වර්ෂය තුළදී වැවිලි ක්ෂේත්‍රයේ ඵලදායීතාව ඉහළ නැංවීම සඳහා පුහුණු වැඩ මුළු දෙකක් පැවැත්වීම සඳහා රු. 373,563 ක වියදම් දරා තිබුණද 2017 පෙබරවාරි 17 දක්වා අදාල නිලධාරීන් වැවිලි ක්ෂේත්‍රයේ අධීක්ෂණ කටයුතු සඳහා යොදවා ගැනීමට කටයුතු කර නොතිබුණි.

**3.14 මානව සම්පත් කළමනාකරණය**

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2016 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 29 | 24 | 05 | - |
| (ii) | තෘතියික මට්ටම | 04 | 03 | 01 | - |
| (iii) | ද්විතියික මට්ටම | 580 | 541 | 39 | - |
| (iv) | ප්‍රාථමික මට්ටම | 65 | 71 | - | 06 |
| (v) | වෙනත් (අනියම් / තාවකාලික / කොන්ත්‍රාත් පදනම) | 04 | 01 | 03 | - |
| | එකතුව | 682 | 640 | 48 | 06 |